රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 22/99.(XV)

මගේ අංකය :- EST7/TPORT/05/1010
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.
2010.07.07

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත,

**රජයේ නිලධාරීන් / අධිකරණ නිලධාරීන් /රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල නිලධාරීන් සඳහා නිල ප්‍රවාහන පහසුකම්**

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2007.01.04 දිනැති අංක 22/99(IX) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය කෙරේ ඔබේ අවධානය යොමු කරවමි.

02. එම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

**3:5 (අ).** ආනයනය කරනු ලබන වාහනයේ සිලින්ඩර ධාරිතාව පිළිවෙලින් පෙට්‍රල් වාහනයක් නම් 2000 ක් ද ඩීසල් වාහනයක් නම් 3200 ක් ද නොඉක්ම විය යුතුය. වාහනයක් ආනයනය කිරීමේ දී මි.ර.ගැ වටිනාකම නිලධාරීන් දරණ තනතුරු අනුව කාණ්ඩ 03 ක් යටතේ වර්ග කරනු ලැබේ.

**කාණ්ඩ(I).** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 හි විධිවිධාන යටතේ අනුග්‍රාහාත්මක මෝටර් වාහන ආනයන බලපත්‍රයක් ලබා ගැනීමට සුදුසුකම් සපුරාලන, එමෙන්ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන සහ විශ්‍රාම ගන්වනු ලබන හා **අමාත්‍යාංශ ලේකම්, ඊට සමාන හෝ ඊට ඉහළ තනතුරක සිට විශ්‍රාම ලබන නිලධාරීන්හට** (එම තනතුරේ සේවා කාලය කුමක් වුව ද) පහත සඳහන් පිරිවිතරයන්ට යටත්ව අනුග්‍රාහාත්මක මෝටර් වාහන ආනයන බලපත්‍ර නිකුත් කළ යුතුය.

(අ). වාහනයේ උපරිම මි.ර.ගැ. වටිනාකම ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 25,000/- ක උපරිමයට යටත්ව පෙට්‍රල් හෝ ඩීසල් මෝටර් වාහනයක්.

**කාණ්ඩ(II).** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **22/99** හි විධිවිධාන යටතේ අනුග්‍රාහාත්මක මෝටර් වාහන ආනයන බලපත්‍රයක් ලබා ගැනීමට සුදුසුකම් සපුරාලන, එහෙත් ඉහත කාණ්ඩ අංක I න් ආවරණය නොවන, විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී **දෙපාර්තමේන්තු ප්‍රධානී, ඊට සමාන සහ ඊට ඉහළ තනතුරු දරන නිලධාරීන්හට** (එම තනතුරේ සේවා කාලය කුමක් වුව ද) පහත සඳහන් පිරිවිතරයන්ට යටත්ව අනුග්‍රාහාත්මක මෝටර් වාහන ආනයන බලපත්‍ර නිකුත් කළ යුතුය.

**(අ).** වාහනයේ උපරිම මි.ර.ගැ. වටිනාකම ඇමරිකා එක්සත් ජනපද ඩොලර් **22,000/-** ක උපරිමයට යටත්ව පෙට්‍රල් හෝ ඩීසල් මොටර් වාහනයක්.

**කාණ්ඩ(III).** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **22/99** හි විධිවිධාන යටතේ අනුග්‍රාහාත්මක මෝටර් වාහන ආනයන බල පත්‍රයක් ලබා ගැනීමට සුදුසුකම් සපුරාලන, එහෙත් ඉහත කාණ්ඩ අංක **I** හා **II** න් ආවරණය නොවන අනෙකුත් සියළුම නිලධාරීන්හට පහත සඳහන් පිරිවිතරයන්ට යටත්ව අනුග්‍රාහාත්මක මෝටර් වාහන ආනයන බලපත්‍ර නිකුත් කළ යුතුය.

**(අ).** වාහනයේ උපරිම මි.ර.ගැ. වටිනාකම ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් **18,000/-** ක උපරිමයට යටත්ව පෙට්‍රල් හෝ ඩීසල් මොටර් වාහනයක්.

**03.** ඉහත සඳහන් පළමු වැනි හා දෙවැනි කාණ්ඩයන් යටතේ ආවරණය වන තනතුරුවල නාම ලේඛණයක් **ඇමුණුම 1** හි සඳහන් වේ.

**04.** කාණ්ඩ අංක I හා II හි තනතුරක පූර්ණකාලීනව වැඩ බැලීමට හෝ රාජකාරි ඉටුකිරීමට හෝ පත්කර ඇති නිලධාරීන්ට ද මෙම විධිවිධාන අදාළ වේ.

**05.** මෙම සංශෝධිත විධිවිධාන **2010.04.01** දින හෝ එම දිනට පසු විශ්‍රාම යන නිලධාරීන් සඳහා වලංගු වේ.

**06.** මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාවය මත නිකුත් කරනු ලැබේ.

ඩී. දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය

**කාණ්ඩ I.:** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 යටතේ අනුග්‍රාහාත්මක මොටර් වාහන ආනයන බලපත්‍රයක් සඳහා සුදුසුකම් ලබන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන සහ විශ්‍රාම ගන්වනු ලබන නිලධාරීන්.

I. අග්‍ර විනිශ්චයකාරවරයා
II. නීතිපතිවරයා
III. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරු
IV. අභියාචනාධිකරණයේ සභාපතිවරයා
V. අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරු
VI.. ජනාධිපති ලේකම්
VII. අග්‍රාමාත්‍ය ලේකම්
VIII. අමාත්‍ය මණ්ඩල ලේකම්
IX. කැබිනට් අමාත්‍යාංශයක ලේකම්
X. ජනාධිපති ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩල ප්‍රධානී
XI. පළාත් ප්‍රධාන ලේකම්
XII. විගණකාධිපති
XIII. මැතිවරණ කොමසාරිස්
XIV. ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී
XV. යුධ හමුදපති
XVI. නාවුක හමුදපති
XVII. ගුවන් හමුදපති
XVIII. පොලිස්පති

**කාණ්ඩ II:** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 යටතේ අනුග්‍රාහාත්මක මොටර් වාහන ආනයන බලපත්‍රයක් සඳහා සුදුසුකම් ලබන, ඉහත I කාණ්ඩයෙහි ඇතුලත් නොවන දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ඊට සමාන හා ඊට ඉහළ තනතුරු හොබවන නිලධාරීන්.

I. භාණ්ඩාගාරයේ නියොජ්‍ය ලේකම්
II. ජනාධිපති ලේකම් කාර්‍යාලයේ, අග්‍රාමාත්‍ය ලේකම් කාර්‍යාලයේ, අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ අතිරේක ලේකම්
III. කැබිනට් අමාත්‍යාංශවල අතිරේක ලේකම්
IV. සොලිසිටර් ජනරාල්
V. දිසාපති / දිස්ත්‍රික් ලේකම්
VI. මහාධිකරණයේ විනිශ්චයකාරවරු
VII. නීති කෙටුම්පත් සම්පාදක
VIII. කැබිනට් අමාත්‍යංශයක /දෙපාර්තමේන්තුවක දෙපාර්තමේන්තු ප්‍රධානී / අධ්‍යක්ෂ ජනරාල් / කොමසාරිස් ජනරාල් / දුම්රිය සාමාන්‍යාධිකාරී
IX. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පත් කරනු ලබන කොමිෂන් සභාවක අධ්‍යක්ෂ ජනරාල්

**කාණ්ඩ III :** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 යටතේ අනුග්‍රාහාත්මක මොටර් වාහන ආනයන බලපත්‍රයක් සඳහා සුදුසුකම් ලබන, ඉහත කාණ්ඩ I හා II යටතේ ආවරණය නොවන අනෙකුත් සියළුම නිලධාරීන්